**පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන සහ**
**වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතුයටිතල පහසුකම්,**
**කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය**

# බස්නාහිර පළාත

## පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)

# සෘජු සම්මුඛ පරීක්ෂණ

### 01. ඉංජිනේරු (සිවිල්) - තනතුරු 07 යි

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් B.Sc. ඉංජිනේරු විද්‍යාව (සිවිල්) උපාධියක් ලබා තිබීම සහ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

සමග

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) ආශ්‍රිත ඉංජිනේරුවරයකු ලෙස ලියාපදිංචිය ලබා තිබීම.

**වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**ස්ථිර පදිංචිය** : ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. බස්නාහිර පළාත තුළ අවුරුදු 03 ක ස්ථිර පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

**මාසික කොන්ත්‍රාත් දීමනාව (අවම)** : රු. 75,143.00 + රු. 17,800.00 (ජීවන අංක දීමනාව)

### 02. කාර්මික නිලධාරී - තනතුරු 18 යි

**සුදුසුකම්** : තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ) 05 ට නොඅඩු විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස් සීමාව** : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**ස්ථිර පදිංචිය** : ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර, අවුරුදු 3 ක කාලයක් සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

**මාසික කොන්ත්‍රාත් දීමනාව (අවම)** : රු. 43,379.00 + රු. 17,800.00 (ජීවන අංක දීමනාව)

### 03. වැඩ අධීක්ෂක - තනතුරු 03

**සුදුසුකම්** :

(අ) පහත විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස. (සා/පෙ) විභාගය විෂයන් හයකින් (06) සමත් වී තිබීම.

i. සිංහල / දෙමළ

ii. ගණිතය

සහ

(ආ) අ.පො.ස. (උ/පෙ) විභාගය විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

සහ

(ඇ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ) 05 ට නොඅඩු, විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග අ.පො.ස. (සා/පෙ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

**වයස් සීමාව** : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**ස්ථිර පදිංචිය** : ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර, අවුරුදු 3 ක කාලයක් සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

**මාසික කොන්ත්‍රාත් දීමනාව (අවම)** : රු. 40,403.00 + රු. 17,800.00 (ජීවන අංක දීමනාව)

වෙනත්

**සියලුම අයදුම්කරුවන්,**

i. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ii. විශිෂ්ඨ සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

**මාසික කොන්ත්‍රාත් දීමනාව** : අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද මත තීරණය කරනු ලැබේ.

**රැකියා කොන්දේසි** : පත්වීම වසරක කොන්ත්‍රාත් පදනමක් මත සිදු කෙරේ. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනුලබන නිලධාරීන්ට, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ (බස්නාහිර පළාත) කිසිදු ස්ථිර පත්වීමක් සඳහා හිමිකම් කිව නොහැක.

**වෙනත් ප්‍රතිලාභ** : සේවක අර්ථසාධක අරමුදල සඳහා අධිකාරිය මගින් 12% ක් බැර කරනු ලබන අතර සේවකයා විසින් 8% ක් බැර කළ යුතුය. සේවක භාරකාර අරමුදල සඳහා අධිකාරිය විසින් 3% ක දායකත්වයක් ලබා දෙන අතර, රජයේ අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.

**අවශ්‍ය ලිපි ලේඛන** : ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) සම්බන්ධතා විස්තර සමග සම්පූර්ණ ජීව දත්ත (CV) පත්‍රයක්

අදාළ සුදුසුකම් / පළපුරුද්ද සනාථ කෙරෙන සහතික (මුල්පිටපත්)

උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත.

**දිනය හා වේලාව** : 2025 දෙසැම්බර් 09 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා (කරුණාකර 2025 දෙසැම්බර් 08 වන දින හෝ ඊට පෙර ජීව දත්ත පත්‍රය prdahrm@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය වෙත එවන්න)

**ස්ථානය** : **දෙවන (2 වන) මහල,**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප.)**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.**
**දුරකථන : 0112321996, 0715101501, 0714526202**